# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## උපාධි ප්‍රදානෝත්සවය - 2025 ජූලි 14

2025 ජූලි මස 14 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට නියමිත උපාධි ප්‍රදානෝත්සවයෙහි පළමු, දෙවන හා තෙවන සැසිවලට අදාළ නාමලේඛන අප වෙබ් අඩවියෙහි (www.cdce.kln.ac.lk) මේ වන විට පළකර ඇත.

මෙම නාම ලේඛනයන් හි සඳහන් ඔබගේ නමෙහි අක්ෂරයන් හි යම් සංශෝධනයක් සිදුකිරීමට ඇත්නම් ඒ බව සඳහන් කරන ලද විද්‍යුත් පණිවිඩයක් 2025 මැයි මස 16 දිනට පෙර cdce@kln.ac.lk යන විද්‍යුත් ලිපිනයට යොමුකරන ලෙස මෙයින් දන්වමි.

තවද මේ වන විට උපාධි ප්‍රදානෝත්සවය සඳහා අයදුම් කරන ලද සියලුම උපාධිලාභීන්ගේ නම් උපාධිලාභී නාමලේඛනයන්ට ඇතුළත් කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කරන ලද නමුත් මෙම ලේඛනයන් හි නම් ඇතුළත්ව නොමැති උපාධිලාභීන් වෙතොත් ඒ බව ඉහත විද්‍යුත් ලිපිනයට 2025 මැයි මස 16 දිනට පෙර දන්වන ලෙස වැඩිදුරටත් දන්වමි.

මෙම උපාධිලාභීන් සඳහා උපාධි ලෝගුව හා කරමාලය ලබාදෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.
කැලණිය විශ්වවිද්‍යාලය
2025.05.14